# <u>මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය</u>

***(2018 ඔක්තෝම්බර් මස 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා)***

මෙම වාර්තාව මගින් 2018 ඔක්තෝබර් මස 01 වන දින සිට 2018 දෙසැම්බර් මස 31 වන දින දක්වා මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් ආවරණය කෙරේ.

### 01. 2019 වර්ෂය සඳහා නිර්දේශ

2019 වර්ෂය සඳහා ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳ නිර්දේශ භාෂාත්‍රයෙන් සකස් කර 2018 නොවැම්බර් මස 28 වන දින ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 (ජ) වගන්තිය අනුව)

### 02. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සංශෝධනය -2018

පළාත් විසින් කරන ලද ඉල්ලීම් මත පදනම්ව, 2018 වර්ෂයේ පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම්වල පුළුල් ක්‍රියාකාරකම් පරාස දක්වා වූ සංශෝධන හා "විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සඳහා වන ප්‍රදාන'' යටතේ පළාත් විසින් හඳුනාගත් ව්‍යාපෘති සඳහා ප්‍රතිපත්තිමය එකඟතාව ලබා දී ඇත.

### 03. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2017

2017 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් මුද්‍රණය කර 2018 දෙසැම්බර් 05 වන දින අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත.

### 04. මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්ම

මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන කර ඇත.

### 05. ක්‍රියාකාරී සැලැස්ම - 2019

2019 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම උපාය මාර්ගික සැලැස්ම පදනම් කරගෙන සකස් කර ඇති අතර එය කොමිෂන් සභාවට යොමු කිරීමට නියමිතව ඇත.

### 06. පළාත් විගණන වාර්තා පිළිබඳ වාර්තා සැකසීම

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද නැගෙනහිර, මධ්‍යම හා සබරගමුව යන පළාත්වල විගණන වාර්තා අධ්‍යයනය කරන ලද අතර, ඒ පිළිබඳ කොමිෂන් සභාවේ නිරීක්ෂණයන් පළාත්වල වගවීම වැඩිදියුණු කිරීම උදෙසා ප්‍රධාන ලේකම්වරුන් හා ආණ්ඩුකාරවරුන් වෙත යොමු කරන ලදී.

### 07. මුදල් කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීම

මුදල් කොමිෂන් සභාව සඳහා ඉදිකරන කරන ලද නව කාර්යාල ගොඩනැගිල්ල රුපියල් මිලියන 442 ක පිරිවැයකින් යුතුව නිම කරන ලදී. 2018 අගෝස්තු මස 15 වන දින සිට මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය නව ගොඩනැගිල්ලේ කාර්යාල කටයුතු පවත්වාගෙන යාම ආරම්භ කරන ලද අතර නුදුරු දිනෙක අතිගරු ජනාධිපතිතුමා අතින් උත්සවාකාරයෙන් විවෘත කෙරේ.

**08.** **මුදල් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය**

ආසියානු පදනම (TAF) විසින් මුදල් කොමිෂන් සභාවේ කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි සංවර්ධකයා ලෙස "තීක්ෂණ" නම් වූ සමාගමක් තෝරාගෙන ඇති අතර, ඔවුන් දැනටමත් පුනරාවර්තන වියදම් සඳහා වූ පද්ධතිය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටි. පද්ධතිය සංවර්ධනයට ප්‍රථම එවන ලද මෘදුකාංග හා ආයතන පිරිවිතරය (SRS) මුදල් කොමිෂන් සභාව විසින් පරීක්ෂා කරන ලදී.

මීට අමතරව, පළාත් සංවර්ධනය සඳහා අදාල ආදායම් සහ ප්‍රාග්ධන යන අංශ ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය පුළුල් කිරීම සඳහා ආසියා පදනම "තීක්ෂණ" සමාගම සමග සාකච්ඡා කර ඇත. ප්‍රාග්ධන හා ආදායම් අංශ සඳහා පද්ධති සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා එම සමාගමම යොදා ගැනීමට කොමිෂන් සභාව අනුමැතිය ලබාදී ඇත. දැනටමත් ආරම්භ කර ඇති පුනරාවර්තන වියදම් පද්ධතිය එම සමාගම විසින් සංවර්ධනය කරමින් පවතින අතර මෙම පද්ධතියේ මූලාකෘතිය මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

**09.** **මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත**

පනත් කෙටුම්පතට අදාල මුදල් කොමිෂන් සභාවේ නිරීක්ෂණයන් නීති කෙටුම්පත් සම්පාදක වෙත සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලද අතර, 2018 ඔක්තෝබර් මස 18 වන දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත අප වෙත ලබාදෙන ලදී. එය 2018 ඔක්තෝබර් මස 26 වන දින නැවත නීතිපතිවරයා වෙත යොමු කරන ලදී.

**10.** **අධ්‍යයනය චාරිකා**



2018 නොවැම්බර් මස 27 වන දින මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය හා කාර්යයන් පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා පරිපාලන වෛද්‍යවරුන් පිරිසක් මුදල් කොමිෂන් සභාව වෙත පැමිණෙන ලදී. එම වෛද්‍යවරුන් සඳහා කරන ලද ඉදිරිපත් කිරීම් තුළ නිර්දේශ ක්‍රියාවලිය, සැලසුම්කරණය හා අයවැය සැකසීම, පළාත්වලට ලබාදෙන මූල්‍ය ප්‍රදානයන්, පළාත්වල ආදායම් ප්‍රභවයන්, පළාත් පාලනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සහ පළාත් කාර්ය මණ්ඩල යනාදී කරුණු අන්තර් ගත විය.

**11.** **කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය**

**11.1.** **පුහුණු අවස්ථා**

පහත සඳහන් තෝරාගත් ක්ෂේත්‍රයන් වලට අදාලව මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් කිහිප දෙනෙකුහට පුහුණු අවස්ථාවන් ලබාදීමට හැකි වී ඇත,

- කම්කරු නීතිය (සාප්පු හා කාර්යාල පනත, පාරිතෝෂිත, සේ.අ.අ.හා සේ. භා. අ.ආදිය)
- රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන

**11.2.** ආරාධිත දේශන

පහත සඳහන් ආරාධිත දේශකයන් මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

| අනු අංකය | නම | මාතෘකාව | දිනය |
|---|---|---|---|
| 01. | වෛද්‍ය තමරා බෝගොඩ මිය. | ආයුර්වේදය සමග සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් | 2018 ඔක්තෝම්බර් 09 වන දින |
| 02. | මහාචාර්ය එස්.පී. ප්‍රේමරත්න මයා ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය. | ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ගැටළු | 2018 නොවැම්බර් 29 වන දින |
| 03. | මහාචාර්ය දියනාත් සමරසිංහ මයා මනෝ වෛද්‍ය උපදේශක. | මුදල් හා සෞඛ්‍ය | 2018 දෙසැම්බර් 12 වන දින |



මහාචාර්ය දියනාත් සමරසිංහ මහතාගේ දේශනය



මහාචාර්ය එස්.පී. ප්‍රේමරත්න මහතාගේ දේශනය

**11.3.** කාර්ය මණ්ඩල අධ්‍යයනයන්

මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් පහත දැක්වෙන තාක්ෂණික අධ්‍යයනයන් මුදල් කොමිෂන් සභාව සඳහා ඉදිරිපත් කරන ලදී.

| නම | මාතෘකාව |
|---|---|
| • එස්. එම්. ආර්. එස්. බණ්ඩාර මහතා, අධ්‍යක්ෂක | මුදලෙහි අගය |
| • ඒ. ආර්. මරිනා මෙනවිය, සහකාර පර්යේෂණ නිලධාරි | පළාත් පාලනය |
| • ජී. කොඩිකාර මහතා, සහකාර පර්යේෂණ නිලධාරි | පළාත් පාලන අධිකාරීන්හි ආදායම් ඉහළ නැංවීම |
| • ආර්. රණසිංහ මිය, සහකාර පර්යේෂණ නිලධාරි | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය |
| • නිමාලි රත්නායක මිය, සංඛ්‍යාලේඛන නිලධාරිනි | ශ්‍රී ලංකාවේ නිවාස |

## 12. 2018 සහ 2019 අයවැය රැස්වීම්

ප්‍රධාන ලේකම්වරුන් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (මුදල්) සමග 2019 ඔක්තෝබර් 05 වන දින මුදල් කොමිෂන් සභාවෙහි දී රැස්වීමක් පවත්වන ලදී. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද මේ සඳහා සහභාගී විය.



මෙම රැස්වීමේහි ප්‍රධාන අරමුණ වූයේ, 2018 පළාත් අයවැය හා 2019 වර්ෂය සඳහා ප්‍රතිපාදනයන් වෙන් කිරීම පිළිබඳ ගැටලු සාකච්ඡා කිරීම හා නිර්දේශයන් ඉදිරිපත් කිරීමට ප්‍රධාන ලේකම්වරුන්ට අවස්ථාව ලබා දීමයි.

## 13. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ආහාර වටිනාකම් දාම සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් ආහාර තාක්ෂණික උද්‍යාන සංවර්ධනය කිරීම පිළිබඳ දෙදින ජාතික ජාතික වැඩමුළුව

මුදල් කොමිෂන් සභාව ප්‍රතිපත්ති සම්පාදනය තුළින් තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් පළාත් සභා සඳහා අරමුදල් වෙන් කිරීම තුළින් සමාජ ආර්ථික විෂමතා අඩු කරනු ලබයි.



ශ්‍රී ලංකාවේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම උදෙසා ආහාර වටිනාකම් දාම සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් පළාත් ආහාර තාක්ෂණික උද්‍යාන සංවර්ධනය කිරීමට පාර්ශවකරුවන්ගේ අදහස් ලබාගැනීම සඳහා මාණ්ඩලික නිළධාරීන් විසින් දින දෙකක ජාතික වැඩමුළුවක් සංවිධානය කිරීමට සැලසුම් කර ඇත.

අපේක්ෂිත දෙදින වැඩමුළුව ජනාධිපති ලේකම් කාර්යාලයත්, ශ්‍රී ලංකා මුදල් කොමිෂන් සභාව සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හා ආසියානු පදනම සමඟ සහයෝගයෙන් එක්ව සංවිධානය කරනු ලබයි.

මෙම කාර්තුවේදී, එනම් ඔක්තෝබර් මස 9, 19, 29 සහ නොවැම්බර් මස 13 යන දිනවල රැස්වීම් පැවැත්විණි. ලබන වසරේදී යෝජිත වැඩමුළුව පැවැත්වීමට අපේක්ෂිතය.

## 14. 2019 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම්, මාර්ගෝපදේශ හා වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම සම්බන්ධ රැස්වීම්



මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද 2019 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම, මාර්ගෝපදේශ හා වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම (අංශ, සංරචක සහ උප සංරචක) සඳහා විශේෂ රැස්වීමක් ඔක්තෝම්බර් මස 16 වන දින පවත්වන ලදී. මෙම රැස්වීම සඳහා සියලුම පළාත්වල නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම්) සහභාගි වූහ.

## 15. සමාජ-ආර්ථික දර්ශක සහ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය මැනීම පිළිබඳ සාකච්ඡාව



මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව නියෝජනය කළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2018 දෙසැම්බර් මස 05 වන දින මුදල් කොමිෂන් සභාවේදී පැවැත්විණ. පළාත් අතර විෂමතාවයන්ගේ ස්වභාවය හඳුනා ගැනීම හා මනා අධ්‍යයනයක් තුළින් ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම සඳහා වන ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම ප්‍රධාන අරමුණු විය.

සාකච්ඡාවට අනුව, යෝජිත මෙහෙයුම් කමිටුව හා නියාමන කමිටුව සඳහා වන කාර්යභාරය කෙටුම්පත් කර නිරීක්ෂණයන් සහ අදහස් ලබාගැනීම සඳහා 2018 දෙසැම්බර් මස 12 වන දින සහභාගීවූවන්ට හා එම ආයතන ප්‍රධානීන්ට ඉදිරිපත් කරන ලදී.

## 16. අභ්‍යන්තර විගණන කමිටුව

අභ්‍යන්තර විගණන කමිටුවේ 04 වන රැස්වීම් වාරය 2018 දෙසැම්බර් මස 11 වන දින කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරීවරයාගේ සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකවරයාගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. අවශ්‍ය පසු විපරම් කටයුතු සඳහා රැස්වීමේදී ගනු ලැබූ තීරණයන් මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට දැනුම් දෙන ලදී. අභ්‍යන්තර විගණනයට අදාල කටයුතු විධිමත් කිරීමට අමතරව කාර්යසාධනය උදෙසාද විය යුතු බව කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය මුදල් කොමිෂන් සභාවේ සලකා බැලීම සඳහා අධ්‍යයනයට ලක් කර ඇති අතර, ඒ අනුව අභ්‍යන්තර විගණන වැඩපිළිවෙළ සකස් කර ඇති අතර එය කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලැබේ.

**17. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය හා ශ්‍රී ලංකා මුදල් කොමිෂන් සභාව අතර අවබෝධතා ගිවිසුම**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය සමග ඒකාබද්ධව පර්යේෂණ කටයුතු සිදු කිරීම කොමිෂන් සභාවේ බලාපොරොත්තුව වේ.

මෙම ප්‍රයත්නය තුළින් මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ පර්යේෂණ ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධනය කිරීමට ද අපේක්ෂා කෙරේ. මෙම අභ්‍යාසය ඉදිරියට ගෙනයාම සඳහා අවබෝධතා ගිවිසුමක් කෙටුම්පත් කර ඇති අතර, එය තවදුරටත් විධිමත් කරගැනීමට අවශ්‍ය නිරීක්ෂණ සඳහා 2018 නොවැම්බර් මස 30 වන දින ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය වෙත යොමු කරන ලදී.

**18. අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම් - 2019**

2019 වර්ෂය සඳහා පළාත් සභාවල අයවැය ප්‍රතිපාදන සඳහා මුදල් කොමිෂන් සභාවේ උපදෙස් ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත. මුදල් කොමිෂන් සභාව විසින් එළඹෙන වසරට අදාල මූල්‍ය ප්‍රදාන පිළිබඳ විස්තර හා ආදායම් ඉලක්ක සහිතව වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ මාර්ගෝපදේශ නව වසර ආරම්භයට ප්‍රථම පළාත් වෙත නිකුත් කරනු ලබයි. කෙසේවෙතත්, පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද වාර්ෂික විසර්ජන පනත් කෙටුම්පතක් නොමැති වීම හේතුවෙන් මේ වසරේදී එය එසේ කිරීමට අපොහොසත් විය.

මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කළ පරිදි, 2019 වර්ෂයේ පළමු මාස හතර සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බවත්, එය පාර්ලිමේන්තුවේ සම්මත වුවහොත්, එළඹෙන වසරේ පළමු මාස හතර සඳහා පුනරාවර්තන වියදම සමඟ 2018 වර්ෂයෙහි ප්‍රාග්ධන බිල්පත් පියවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රදානයන් පළාත් වෙත ලැබෙන බව සියලු ප්‍රධාන ලේකම්වරුන් වෙත දන්වා යවන ලදී.

**19. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව**

2018 නොවැම්බර් මස 09 වන දින 2018 වර්ෂයේ තුන්වන කාර්තුව සඳහා සකස් කළ කාර්යසාධන වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**20. ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම**

2017 දී කොමිෂන් සභාව විසින් සම්මත කරන ලද පාලන සංග්‍රහයේ විධිවිධාන අනුව, ප්‍රධාන විධායක නිලධාරීන් (ලේකම්) සහ සෙසු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන්ගේ (අධ්‍යක්ෂ මණ්ඩලයේ) කාර්ය සාධනය කොමිෂන් සභාවේ අනු කමිටුව විසින් ඇගයීමට ලක් කරන ලද අතර, ඔවුන්ගේ වාර්තාව 2018 නොවැම්බර් මාසයේදී කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා කාර්තුමය පදනම මත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය ඇගයීම සඳහා කොමිෂන් සභාව අදහස් කරගෙන සිටී.

**21. වැඩ අධ්‍යනය**

මුදල් කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයන් අනුව වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස කාර්යභාරය ඉටු කිරීම පිණිස කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වැඩ අධ්‍යනයක් සිදු කිරීමට අපේක්ෂා කර ඇත.

අධ්‍යනයනයේ මූලික අරමුණ වන්නේ කොමිෂන් සභාව තුළ මානව සම්පත හා තාක්ෂණය උපයෝගී කර ගනිමින් එක් එක් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් දැඩි අධ්‍යයනයක් කිරීමෙන් ආයතනයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීමයි.

## 22. රැස්වීම්, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා සහභාගී වීම්

මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් සහ කාර්ය මණ්ඩලය පහත සඳහන් රැස්වීම් / වැඩමුළු සඳහා සහභාගි වූහ.

- සේවක ඇගයීම මොරටුව මහනගර සභාව
- සේවක ඇගයීම පානදුර නගර සභාව
- උගත් පාඩම් මගින් දේශීය ආර්ථිකය සකසා ගැනීම
- දේශීය ආර්ථික සංවර්ධනය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් බෙදා ගැනීමේ වැඩමුළුව
- පළාත් පාලන ආයතන කාර්යමණ්ඩල සමාලෝචනය
- බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තෙමේන්තුවේ සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම
- ස්ත්‍රී පුරුෂ භාවයට අනුකූල අයවැයකරණය
- ශ්‍රී ලංකාවේ වඩා හොඳ කම්කරු සබඳතා සඳහා කම්කරු නීතිය අවබෝධ කර ගැනීම
- කෘෂිකර්ම උපදේශක විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු වැඩි කිරීම - දකුණු පළාත
- නව තනතුරු ඇති කිරීම - පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව - දකුණු පළාත
- ශ්‍රී ලංකාවේ පෝෂණය සඳහා රාජ්‍ය වියදම් සමාලෝචනය
- 21 වන සියවසයේ පෝලන්තය, මධ්‍යම යුරෝපීය රටවල් සඳහා වූ අවස්ථා සහ තර්ජන
- ආසියාවේ මානව හිමිකම් සන්දර්භානුගත කිරීම - එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තියේ 70 වන සංවත්සරය.
- නව දකුණු ආසියාවට ඉන්දියාව, චීනය හා සිංගප්පූරුව සමග මිත්‍රත්වයක් අවශ්‍ය වන්නේ ඇයි?
- මධ්‍යම ආදායම් ලබන රටවල තිරසාර සංවර්ධනය
- ප්‍රධාන ලේකම්වරු 33 දෙනෙකුගේ සම්මේලනය

## 23. විශේෂ අධ්‍යයනයන්

මුදල් කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්වල සහාය සඳහා විශේෂ අධ්‍යයන ගණනාවක් සිදු කරන ලදී,

එනම්,

- ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා පුද්ගලික අංශයේ සහභාගිත්වය -2017
- රේඛීය අමාත්‍යාංශ විසින් අයවැය ප්‍රතිපාදන පළාත් අතර බෙදා හැරීම් පිළිබඳ අධ්‍යයනය
- පළාත් සභා, ව්‍යවස්ථාපිත ආයතන / පළාත් අධිකාරී සහ පළාත් පාලන ආයතනයන් හී කාර්ය මණ්ඩලය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය

## 24. මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය කාර්යසාධනය මුදල් කොමිෂන් සභාව විසින් මාසිකව සමාලෝචනය කරන ලදී.

## 25. මුදල් කොමිෂන් සභාවේ අනුකූලතා වාර්තාව

ආයතනයේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සියලු අනුකූලතාවන් සපුරා ඇති බව කොමිෂන් සභාව සහතික කරයි. මේ සම්බන්ධයෙන් වන අනුකූලතා වාර්තා මාසිකව කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබේ.

## 26. මුදල් කොමිෂන් සභාවේ විගණන වාර්තාව

මුදල් කොමිෂන් සභාවේ විගණන වාර්තාව 2018 නොවැම්බර් මස 27 වන දින ලැබුණු අතර, 2018 නොවැම්බර් මස 29 වන දින එයට අදාල පිළිතුරු වාර්තාව විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

## 27. ආංශික අධ්‍යයනයන්

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සඳහා කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ ආංශික පදනමක් ද සහිතව ඉදිරිපත් කරයි. මේ සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව සෞඛ්‍ය, අධ්‍යාපනය, වාරිමාර්ග, කෘෂිකර්මය සහ සමාජ සේවා වැනි අංශ සඳහා අධ්‍යනයන් කිහිපයක් ආරම්භ කර ඇත. ඒවා අතිගරු ජනාධිපතිතුමන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේදී මෙන්ම පළාත්වලට අරමුදල් වෙන් කිරීම සඳහා ද භාවිතා කරනු ලැබේ.

## 28. ප්‍රාදේශීය සංවර්ධනය සඳහා මාධ්‍ය භාවිතය

දිනපතා ජාතික පුවත්පත්වල පළ කරන ලද මාධ්‍ය වාර්තා පිළිබඳව කොමිෂන් සභාව අවධානය යොමු කර ඇත. මීට අමතරව පළාත් පාලන ආයතන සහ පළාත් සභාවලට අදාලව දිනපතා හඳුනාගනු ලබන ප්‍රශ්න සහ ගැටළුවලට අදාල මාධ්‍ය ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (SLBC) සිංහල ජාතික සේවය සමග මූලික සාකච්ඡාවක් කොමිෂන් සභාව විසින් පවත්වන ලදී.

මීට අමතරව ඩේලි නිවුස් පුවත්පතෙහි ඉස්මතු කර ඇති ප්‍රවෘත්ති හා හැන්සාඩ් වාර්තාවේ පළ වී ඇති අදාල කරුණු පිළිබඳව සැලකිල්ල යොමු කර ඇත.

## 29. 2015 වර්ෂයේ සිට 2018 දක්වා කාලය තුළ කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය

මෑතකදී ස්වාධීන කොමිෂන් සභාවලට එරෙහිව නැගී ඇති චෝදනා සමහරක් මුදල් කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ලක්කරන ලදී. ඒ අනුව, කොමිෂන් සභාවේ මෑත කාලීන වසර තුනක කාර්ය සාධනය පිළිබඳව ජනමාධ්‍යවල ප්‍රවෘත්ති පළ කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

## 30. කොමිෂන් රැස්වීම් / විධායක නිලධාරීන්ගේ රැස්වීම් / කාර්ය මණ්ඩල රැස්වීම්

- පහත සඳහන් දිනයන්හි කොමිෂන් රැස්වීම් 04 ක් පවත්වන ලදී,
  - 01. 10. 2018
  - 25. 10. 2018
  - 08. 11. 2018
  - 05. 12. 2018
- කොමිෂන් සභා අනු කමිටුව සෑම කොමිෂන් සභා රැස්වීමකටම පෙර රැස්විය.
- විධායක නිලධාරීන්ගේ රැස්වීම් - සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම් අඛණ්ඩව පැවැත්විණි.
- කාර්ය මණ්ඩල රැස්වීම් - 03.10.2018, 27.11.2018, 31.12.2018 යන දිනවල පවත්වන ලදී.